# චිත්‍ර අඳිමු. ලක්ෂ ගණනින් තෑගි දිනමු!

ජපානයේ ECF සහ Sputnik ජාත්‍යන්තරයේ මෙහෙයවීමෙන් පවත්වනු ලබන

# "WHITE CANVAS" Painting Competition - 2021

## අරමුණ:

අති නවීන ඩිජිටල් තාක්ෂණයන් සමඟ මුසුව ජාත්‍යන්තර තලයට අග්නිදිග ආසියානු කලාකරුවන් ඔසවා තබන තිරසාර කලා ව්‍යාපෘතිය!

2020 දී කාම්බෝජය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල තරුණ කලාකරුවන් සඳහා නව ආරක චිත්‍ර තරඟයක් ලෙස White Canvas කලා ව්‍යාපෘතිය ආරම්භ විය. ඉදිරි වසර 10 සඳහා අපගේ ඉලක්කය වන්නේ කලාපයේ සංවර්ධනය වෙමින් පවතින රටවල සැඟවුණු දක්ෂතා සහිත කලාකරුවන්ට ඔවුනගේ නිර්මාණ එළිදැක්වීමට නව කලා මංපෙත් විවර කරදීමට සහය වීමයි.

මේ සඳහා බ්ලොක් චේන් (Block Chain) සහ අථත්‍ය අවකාශය (Virtual space) යන තාක්ෂණයන් දෙකක් භාවිතා කරනු ලැබේ. එමගින්,

1. කලාකරුවන් සඳහා තිරසාර ජීවනෝපායක් ඇති කිරීම:

කලාකරුවන් හට තම කලාකෘතීන් අලෙවි කිරීමට අවස්ථාව සළසා දෙන අතර, අලෙවියෙන් පසු එයින් යම් ප්‍රතිශතයක් සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතුව හිමිකරගැනීමට අවස්ථාව ලැබේ.

Block Chain තාක්ෂණය භාවිතයෙන් මෙම විප්ලවීය අදහස ප්‍රායෝගිකව යෙදවීමට හැකියාව සළසා ඇත. සම්මානයට පාත්‍ර වන කලාකෘති Startbahn Cert. තාක්ෂණය හරහා සංයුක්ත පරිපථ (IC tags) සවි කර විශේෂිත දත්ත පද්ධතියකට සම්බන්ධ කරනු ලැබේ. කලා කෘතිවල කර්තෘත්වය, හිමිකාරිත්වය සහ එක් එක් ගනුදෙනු සහ විකුණුම් අගයන් පිළිබඳ තීරණාත්මක තොරතුරු Blockchain දත්ත ගබඩාවේ සුරක්ෂිත කර තිබේ. මෙම ව්‍යාපෘතිය තුළින් කලාකරුවා අලෙවිකරුවන්, ගැනුම් කරුවන් සහ රසඥතාවෙන් යුක්ත ප්‍රේක්ෂක පිරිසක් සමඟ සම්බන්ධ කිරීම, එමෙන්ම යාවත්කාලීන සන්නිවේදනය විශේෂතා ලෙස හඳුනාගත හැකිය.

2. කලාපයේ ග්‍රාමීය ප්‍රදේශවල සිටින කලාකරුවන් ලෝකයේ විශාලතම ආර්ථිකයයන් සමඟ සම්බන්ධ කිරීම:

තෝරාගත් කලාකරුවන් විසින් නිර්මාණය කරන ලද කලා කෘති ප්‍රදර්ශනය කිරීම සඳහා අථත්‍ය කලාගාරයක් (Virtual Gallery) ගොඩ නගා ඇති අතර, පරිශීලකයින් එකිනෙකා සමඟ සම්බන්ධ කිරීම සඳහා COMONY නම් විවෘත තාක්ෂණික වේදිකාව මත අභිරුචි ත්‍රිමාණ අවකාශයක් නිර්මාණය කර තිබේ. ඕනෑම කෙනෙකුට ඔහුගේ/ඇයගේ පරිගණකය සහ/හෝ ස්මාර්ට් ජංගම දුරකථනය භාවිතා කර තමාට පහසු වේලාවක කලා කෘති නැරඹීම, අථත්‍ය කලාගාරය තුළදී එවැනිම නරඹන්නෙකු සමඟ සංවාදයේ යෙදීම වැනි දුර්ලභ අත්දැකීම් විඳ ගැනීමට ද හැකියාව සළසා තිබේ.

2021 White Canvas කලා තරඟාවලිය පැවැත්වීම සඳහා මේ වනවිටත් සියලු කටයුතු සූදානම් කර ඇත. එය මෙරට කලාකරුවන්ට සහාය දැක්වීම සඳහා නව ක්‍රම සහ විධි මත පදනම් වූ නව කලා දර්ශනයක් නිර්මාණය කිරීම සඳහා අප තබනා සාර්ථක දෙවැනි පියවරයි.

කලා කෘති සුරක්ෂිතව හා සාධාරණව බෙදා හැරීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින්, කලාපයේ හොඳම නැගී එන කලාකරුවන්ගේ කෘති එක්රැස් කිරීම මෙම තරගය විසින් අරමුණු කරයි. ළමා නිර්මාණකරුවන් දිරිගැන්වීම අරමුණුකොට ළමා කාණ්ඩයක්ද, වයස අවුරුදු 18 හෝ වැඩි නිර්මාණකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීම සඳහා විවෘත කාණ්ඩයක්ද ලෙස කාණ්ඩ වර්ගීකරණය කර ඇති අතර, වෘත්තීය කලාකරුවෙකු වීමට අපේක්ෂා කරන ඕනෑම වයසක අයෙකු සඳහා මෙම තරඟාවලිය තුළ ඉඩහසර වෙන් කර තිබෙන බව සතුටින් දන්වමු.

තෝරාගත් කෘති ජපානයේ මාර්ගගතව සහ නොබැඳි ලෙස ප්‍රදර්ශනය කෙරෙන අතර ලොව පුරා කලාකෘති එක්රැස් කරමින් සිටින රසිකයන් හට රසවිඳීමට සහ මිලට ගැනීමට ඉඩ සළසා තිබේ. මෙම දැවැන්ත ව්‍යාපෘතියේ කොටස්කරුවෙකු වීමට සැඟවුණු දක්ෂතා සහිත ඔබ කළයුත්තේ ඔබේ නිර්මාණ හැකි ඉක්මනින් අප වෙත ලැබීමට සැලැස්වීමයි.

<u>වයස් කාණ්ඩ :</u>

### විවෘත කාණ්ඩය

- අවුරුදු 18 වැඩි (2002. 12. 31 හෝ ඊට පෙර උපන් )

- වාණිජ ගැලරි වල නියෝජන නොමැති කලාකරුවන්

### ළමා කාණ්ඩය

- වයස අවුරුදු 18 අඩු (2003. 01. 01 හෝ ඊට පසු උපන්)

- කලාත්මක දෘෂ්ටි කෝණයෙන් දකින දරුවන්ගේ සිතුවම්

<u>කාලසටහන:</u>

**අයදුම් කිරීම් භාරගන්නා කාලසීමාව:** ජූනි 1 - අගෝස්තු 31, 2021

**තෝරාගැනීම් කාලසීමාව:** සැප්තැම්බර් 1 - ඔක්තෝබර් 31, 2021

**දේශීය සම්මාන උළෙල:** නොවැම්බර්, 2021

<u>**තරග කොන්දේසි :**</u>

**තේමාව:** ඕනෑම නිදහස් තේමාවක්

**මාධ්‍ය:** ඕනෑම මාධ්‍යක්
(තෙල්සායම්, දියසායම්, ඇක්රිලික්, පැස්ටල්, මිනිරන් ආදී; භාවිතා කරමින් පැතලි මතුපිටක සිතුවම් කරන ලද චිත්‍ර)

**චිත්‍රයේ ප්‍රමාණය:** අවම 30 cm x 30 cm හෝ උපරිම 100 cm x 100 cm

උදා:




**අයදුම් කිරීම:** මුලික වශයෙන් එක් චිත්‍රයක් පමණි. (චිත්‍ර කිහිපයක් අයදුම් කිරීමට හැකිවුවද, සම්මානය සදහා පිළිගැනෙන්නේ එක චිත්‍රයක් පමණක් බව කරුණාවෙන් සළකන්න !

**සටහන:** මින් පෙර වෙනත් තරඟ සඳහා ඇතුළත් කර ඇති/ තරඟයක් සඳහා පිළිගත් කලාකෘති හෝ අයදුම්කරු නොවන අයෙකු විසින් නිර්මාණය කරන ලද වැඩ පිටපත් භාරගනු නොලැබේ.

## ශ්‍රී ලංකාවේ සංවිධායක

ස්පුට්නික් ජාත්‍යන්තර ශ්‍රී ලංකා සංවිධානය

දුරකථන: + 94-71-524-0240/ +94-37-494-3163
WhatsApp- +94-71-756-1516

විද්‍යුත් තැපැල: srilanka.wcp@gmail.com

## අයදුම් කරන ක්‍රමය:

1. කැමරාවකින් හෝ Smart Phone එකකින් තම චිත්‍ර නිර්මාණය ඡායාරූපගත කිරීම.

2. අයදුම් පත්‍රය පුරවන අවස්ථාව වනවිට ඔබගේ ජා.හැ.ප (NIC) හෝ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඔබ සතුව තබාගන්න. *(වයස තහවුරු කරගැනීම සඳහා)*

3. අප සඳහන් කර ඇති දිගු (Links) ඔස්සේ ඔබට ලබාදී ඇති අයදුම්පත්‍රය (Google Form) පුරවන්න. >> Submit බොත්තම ඔබන්න. *(අයදුම් පත්‍රය පුරවන අවස්ථාවේදී ඔබට ජා.හැ.ප (NIC)හෝ ඔබගේ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් උඩුගත (Upload) කිරීමට අවස්ථාව ලබාදේ.*

**මෙම ඉහත ක්‍රමය හෝ;**

පහත සඳහන් කර ඇති දිගු (Links) ඔස්සේ ඔබට ලබාදී ඇති අයදුම්පත්‍රය බාගතකර (Download) පුරවන්න. WhatsApp හරහා ඡායාරූපගතකල චිත්‍ර නිර්මාණය සහ ඔබගේ ජා.හැ.ප (NIC) හෝ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් සමග, 071-524-0240 අංකයට යොමු කරන්න.

- දැන් ඔබ තරගය සඳහා සාර්ථකව අයදුම්කර ඇත.

**Google Form සදහා පිවිසුම් දිගු (Links)-**

ළමා කාණ්ඩය: https://forms.gle/mrCN6uyFh3jg4m4fA

විවෘත කාණ්ඩය: https://forms.gle/NU7Yyo7Xo8y7HUpK8

ඉහත ආකාරයට **<u>අයදුම් කිරීමට අපහසු</u>** ළමා, විවෘත කාණ්ඩ වලට අදාල තරගකරුවන් පහත අයදුම්පත බාගතකර (Download) පුරවා WhatsApp හරහා ඡායාරූප ගතකල චිත්‍ර නිර්මාණය සහ ඔබගේ ජා.හැ.ප (NIC) හෝ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් සමග, 071-756-1516 අංකයට යොමු කරන්න..

ළමා කාණ්ඩය: shorturl.at/eBCLQ

විවෘත කාණ්ඩය: shorturl.at/txEG7

## විනිශ්චය කිරීමේ ක්‍රමය:

1. ඔබ අපවෙත එවන සියලුම නිර්මාණ ප්‍රථම වටයේ විනිශ්චය සදහා යොමු කරනු ලැබේ.

2. අවසාන වටයේදී විවෘත කාණ්ඩයෙන් නිර්මාණ 20ක් තෝරාගන්නා අතර ළමා කාණ්ඩයෙන් නිර්මාණ 10ක් තෝරාගනු ලැබේ.

3. අවසාන වටයට තෝරාගනු ලබන නිර්මාණ පහත ලිපිනයට ගෙනවිත් හෝ තැපෑලෙන් සංවිධායක මඬුල්ල වෙත ලැබීමට සැලැස්විය යුතුය.

| |
|---|
| අචාර්ය එශාන්ත ආරියදාස,<br>සභාපති - ස්පුට්නික් ජාත්‍යන්තරය,<br>ගෙපල්ලව, උහුමීය,<br>කුරුණෑගල |

4. මීට අමතරව කාණ්ඩ දෙකෙහිම ප්‍රථම වටයේ විශිෂ්ට නිර්මාණ 100 සදහා වටිනා සහතිකපත්‍ර පිළිගන්වනු ලැබේ.

**<u>මුල්‍යමය ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය</u>**:

| ස්ථානය | ළමා කාණ්ඩය | විවෘත කාණ්ඩය |
|---|---|---|
| 1. ප්‍රථම ස්ථානය | 50,000 | 100,000 |
| 2. දෙවන ස්ථානය | 25,000 | 50,000 |
| 3. තෙවන ස්ථානය | 15,000 | 25,000 |
| විශිෂ්ට කුසලතා | | |
| 04. | විශිෂ්ට කුසලතා සහතික + 5,000 | විශිෂ්ට කුසලතා සහතික + 5,000 |
| 05. | විශිෂ්ට කුසලතා සහතික + 5,000 | විශිෂ්ට කුසලතා සහතික + 5,000 |
| 06. | ඇගයීම් කුසලතා සහතික | විශිෂ්ට කුසලතා සහතික + 5,000 |
| 07. | ඇගයීම් කුසලතා සහතික | විශිෂ්ට කුසලතා සහතික + 5,000 |
| 08. | ඇගයීම් කුසලතා සහතික | විශිෂ්ට කුසලතා සහතික + 5,000 |
| 09. | ඇගයීම් කුසලතා සහතික | විශිෂ්ට කුසලතා සහතික + 5,000 |
| 10. | ඇගයීම් කුසලතා සහතික | විශිෂ්ට කුසලතා සහතික + 5,000 |
| 11-20 වන ස්ථානය දක්වා | - | ඇගයීම් කුසලතා සහතික |

රටේ පවතින නීතිය හා වත්මන් තත්වයට අනුව මෙහි අඩංගු ඕනෑම කරුණක් හෝ තරග කොන්දේසියක් වෙනස්වීම් වලට ලක්විය හැකිඅතර, විනිශ්චය මණ්ඩලයේ හා සංවිධායක මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනබව ප්‍රකාශ කර සිටිමි.

.......................................................

අචාර්ය එශාන්ත ආරියදාස
සභාපති - ස්පුට්නික් ජාත්‍යන්තර ශ්‍රී ලංකා සංවිධානය

Dr. Eshantha Ariyadasa
Chairman
Sputnik International Sri Lanka Organization (SISLO)
Negombo Road, Gepallawa, Uhumeeya, Kurunegala, Sri Lanka.
Tel: 037 2238600, Fax: 037 2228900